මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2022.07.15 |

# ශ්‍රී ලංකා ගැණුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2022 ජුනි

## 2022 ජුනි මාසයේ දී නිෂ්පාදන සහ සේවා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක පහළ යන ලදී.

**නිෂ්පාදන ක්‍රියාකාරකම්හි පෙර මාසයට සාපේක්ෂව පසුබෑමක් පෙන්නුම් කරමින්, නිෂ්පාදන අංශයේ ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය 2022 ජුනි මාසයේ දී පහළ යන ලදී.** ඒ අනුව, නිෂ්පාදන අංශයේ ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය 2022 ජුනි මාසයේ දී පෙර මාසයට සාපේක්ෂව දර්ශකාංක 6.2කින් පහළ යමින් 44.1ක අගයක් වාර්තා කරන ලදී. මෙම පහළ යෑම කෙරෙහි, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය යන උප දර්ශකය හැර අනෙකුත් සියළුම උප දර්ශකයන්ගේ සිදු වූ පහළ යෑම් හේතු විය.

විශේෂයෙන්ම ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශයෙහි නව ඇණවුම් පහත වැටුණු අතර මේ සඳහා ඉහළ උද්ධමනකාරී පරිසරයක් තුළ පාරිභෝගිකයන්ගේ මිලදී ගැනීමේ හැකියාව පිරිහීම ද හේතු විය. විදේශීය ගැනුම්කරුවන් රට තුළ පවතින දේශපාලනික හා ආර්ථික අස්තාවරත්වය සහ ඇණවුම් සම්පූර්ණ කිරීමේදී ඇති විය හැකි බාධා පිළිබඳ කනස්සල්ලෙන් පසුවීම හේතුවෙන් අපනයනාභිමුඛ කර්මාන්ත සඳහා වන නව ඇණවුම් ද අපේක්ෂිත ප්‍රමාණයට වඩා අඩු මට්ටමක පැවතුණි. පෙර මාසයට සාපේක්ෂව 2022 ජුනි මාසයේ දී නිෂ්පාදන මට්ටම්වල පහත වැටීම කෙරෙහි ප්‍රධාන වශයෙන් අමුද්‍රව්‍ය හිඟය සහ පවතින බලශක්ති හිඟය හේතු විය. ඉන්ධන හිඟය නිෂ්පාදනය කෙරෙහි සෘජුව මෙන්ම ප්‍රවාහන අපහසුතා හරහා වක්‍රව ද බලපෑම් එල්ල කරන ලදී. තවද, විශේෂයෙන්ම ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශයේ දක්නට ලැබුණු සේවා නියුක්තියේ පහත වැටීමත් සමග සේවා නියුක්තිය උප දර්ශකය පෙර මාසයට සාපේක්ෂව පහත වැටීමක් වාර්තා කරන ලදී. දේශීය වෙළඳපොළ තුළින් අවශ්‍ය ප්‍රමාණයට අමුද්‍රව්‍ය මිලදී ගැනීමට නොහැකි වීම සහ අමුද්‍රව්‍ය ආනයනය සඳහා ණයවර ලිපි විවෘත කිරීමේ දුෂ්කරතා හේතුවෙන් තොග මිලදී ගැනුම් පහළ යන ලදී. ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය මෙම මාසයේ දී වැඩි වේගයකින් ඉහළ ගිය අතර මේ සඳහා ආනයනික භාණ්ඩ වාරායෙන් නිදහස් කර ගැනීමේ ප්‍රමාදයන්, චීනයේ COVID-19 වෛරසය ව්‍යාප්ත වීම නිසා පනවා ඇති සීමා කිරීම්, නැව් භාණ්ඩ ප්‍රවාහනය ආශ්‍රිත ප්‍රමාදයන් සහ දේශීය ප්‍රවාහනයට බලපෑ ඩීසල් හිඟය ආදිය හේතු විය.

| විචල්‍යය | මැයි | ජුනි | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **50.3** | **44.1** | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| **උපදර්ශක** | | | | |
| නව ඇණවුම් | 47.5 | 38.3 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| නිෂ්පාදන | 44.5 | 36.2 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 51.0 | 45.7 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 39.4 | 34.8 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 71.7 | 72.8 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


රට තුළ පවතින අවිනිශ්චිත ආර්ථික පරිසරය, සැපයුම් අංශයේ බාධාවන් සහ විදේශීය ඉල්ලුම දුර්වල වීමට ඇති හැකියාව ආදිය හේතුවෙන් ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන කටයුතු සඳහා වන අපේක්ෂාවන් තවදුරටත් පෙර මාසයට සාපේක්ෂව පහත යන ලදී.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**44.1**

**2022 මැයි මාසයට සාපේක්ෂව දර්ශකාංක 6.2 ක පහළ යෑමකි**

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2022 මැයි මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.1කින් පහළ යමින් 2022 ජුනි මාසයේ දී 52.2ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

පෙර මාසයට සාපේක්ෂව 2022 ජුනි මාසයේ දී චීනය සහ රුසියාව යන රටවල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය වැඩි වේගයකින් ද යුරෝපා කලාපය, එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, සිංගප්පූරුව සහ ඉන්දියාව යන රටවල අඩු වේගයකින් ද වර්ධනය විය.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2022 ජූලි 14 වන දිනට*

[1] *එස්&පී ග්ලෝබල් (S&P Global) ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් 30 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, අඛණ්ඩව තෙවන මාසයටත් සේවා ක්‍රියාකාරකම්වල පසුබෑමක් පෙන්නුම් කරමින්, 2022 ජූනි මාසයේ දී 40.3ක දර්ශක අගයක් දක්වා තවදුරටත් පහත වැටුණේය.** මේ සඳහා හේතු වූයේ නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම්, සේවා නියුක්තිය සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම් යන උප දර්ශකවල පහළ යෑමයි.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**40.3**


**2022 මැයි මාසයට සාපේක්ෂව දර්ශකාංක 2.1ක පහළ යෑමකි.**

ප්‍රධාන වශයෙන්, ප්‍රවාහන, නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා සහ අධ්‍යාපන යන උප අංශවල දක්නට ලැබුණු පහළ යෑම් සමඟ, 2022 මැයි මාසයට සාපේක්ෂව 2022 ජූනි මාසයේ දී නව ව්‍යාපාර තවදුරටත් පහත වැටුණි.

උග්‍ර ඉන්ධන හිඟය ඇතුළුව සැපයුම් සම්බන්ධව පවත්නා අඛණ්ඩ දුෂ්කරතා හේතුවෙන් සේවා අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම් ජූනි මාසයේ දී තවදුරටත් පහත වැටුණි. තවද, ඉහළ උද්ධමන පීඩනය, පොලී අනුපාත ඉහළ යෑම, ප්‍රවාහනය ආශ්‍රිත ගැටළු මෙන්ම ආර්ථිකය පිළිබඳව පවත්නා අසුබවාදී දැක්ම හේතුවෙන් පාරිභෝගික වියදම් පහත වැටුණු අතර, විශේෂයෙන්ම අත්‍යවශ්‍ය නොවන අයිතමවලට අදාළ ඉල්ලුම තවදුරටත් අඩු වී ඇති බව බොහෝ ප්‍රතිචාර දක්වන්නන් විසින් සඳහන් කරන ලදී. මෙම තත්ත්වයන් හේතුවෙන්, අනෙකුත් පෞද්ගලික සේවා, ප්‍රවාහන, තොග සහ සිල්ලර වෙළඳාම, නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා සහ අධ්‍යාපන යන උප අංශවල සීඝ්‍ර පහළ යෑම් ජූනි මාසය තුළ වාර්තා විය. මේ අතර, ශ්‍රී ලංකාවේ සංචාරය කිරීම සම්බන්ධයෙන් වන අනතුරු ඇඟවීම් හේතුවෙන් සංචාරක පැමිණීම් අඛණ්ඩව පහත වැටීම, ඒ හා සම්බන්ධ උප අංශ කිහිපයකට අදාළ ව්‍යාපාර ක්‍රියාකාරකම් කෙරෙහි ද අහිතකර ලෙස බලපෑවේය.

නව බඳවාගැනීම් අත්හිටුවීම්, සේවා ගිවිසුම් දීර්ඝ නොකිරීම්, විශ්‍රාම යෑම් සහ සේවයෙන් ඉවත්වීම් හේතුවෙන් 2022 ජූනි මාසයේ දී සේවා නියුක්තිය අඛණ්ඩව පහත වැටුණි. මේ අතර, ඉන්ධන සහ අනෙකුත් සැපයුම් හිඟය, කාර්ය මණ්ඩලවලට මුහුණ දීමට සිදු වූ ප්‍රවාහන දුෂ්කරතා සහ විදුලි කප්පාදුව හේතුවෙන් නිමකිරීමට නියමිත කාර්යයන් තවදුරටත් ඉහළ ගියේය.

සේවා අංශයෙහි
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි වර්ධනයක් පෙන්නුම් කරමින්, ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2022 මැයි මාසයේ පැවති 51.9 සිට 2022 ජූනි මාසයේ දී 53.9 දක්වා ඉහළ ගියේය.

චීනය, ඇමරිකා එක්සත් ජනපදය, ඉන්දියාව, එක්සත් රාජධානිය සහ ජපානය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ පසුගිය මාසයට සාපේක්ෂව 2022 ජූනි මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2022 ජූලි 14 වන දිනට*

| විචල්‍යය | මැයි | ජූනි | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **42.4** | **40.3** | **-** | **වැඩි වේගයකින් පහළ යෑමක්** |
| | | <u>උපදර්ශක</u> | | |
| නව ව්‍යාපාර | 45.5 | 43.2 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 39.0 | 35.1 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 38.5 | 38.9 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 51.6 | 52.2 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 37.4 | 32.3 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් 2022 ජූනි මාසයේ දී තවදුරටත් පහත වැටුණු අතර, මේ සඳහා රට තුළ දිනෙන් දින වර්ධනය වන අවිනිශ්චිතතා මධ්‍යයේ පවත්නා අහිතකර සැපයුම් සහ ඉල්ලුම් තත්ත්වයන් හේතු විය.

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.